පාර්ලිමේන්තුවේ පුස්තකාලය
කොළඹ.

# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 19 දරන
# සම්බුද්ධ ජයන්ති චෛත්‍ය භාරය
# පනත

---

[සහතිකය සටහන් කළේ 1980 අප්‍රේල් මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 අප්‍රේල් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක

මිළ : ශත 65 යි    තැපැල් ගාස්තුව : ශත 35 යි

# 1980 අංක 19 දරන සම්බුද්ධ ජයන්ති චෛත්‍ය භාරය පනත

[සහතිකය සටහන් කළේ 1980 අප්‍රේල් මස 18 වන දින]

එල්.ඩී.—ඕ. 7/79.

**සම්බුද්ධ ජයන්ති චෛත්‍ය භාරය යනුවෙන් නම් කරනු ලබන භාරයක් පිහිටුවීම පිණිස ද එහි පරමාර්ථ හා බලතල නිශ්චිතව දැක්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1980 අංක 19 දරන සම්බුද්ධ ජයන්ති චෛත්‍ය භාරය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. (1) සම්බුද්ධ ජයන්ති චෛත්‍ය භාරය යනුවෙන් නම් කරනු ලැබිය යුතු (මෙහි මින් මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ) භාරයක් පිහිටුවනු ලැබිය යුතු ය. **සම්බුද්ධ ජයන්ති චෛත්‍ය භාරය පිහිටුවීම.**

(2) භාරය, (1) වන උපවගන්තියෙන් එයට පවරනු ලබන නාමයෙන්, සංස්ථාවක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද, ඒ නාමයෙන්, භාරය විසින් නඩු පැවරීම ද භාරයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

3. (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) භාරකාර මණ්ඩලයක් විසින් භාරය පරිපාලනය කරනු ලැබිය යුතු ය:— **භාරකාර මණ්ඩලයේ සංයුතිය සහ එහි රැස්වීම.**

(අ) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිලධරයෙක් ;

(ආ) ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරියේ සභාපතිවරයා ;

(ඇ) සංස්කෘතික කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයේ නිලධරයෙක් ;

(ඈ) භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන, මහා භාණ්ඩාගාරයේ නිලධරයෙක් ;

(ඉ) මහා භාරකාරවරයා විසින් නම් කරනු ලබන, මහා භාරකාර දෙපාර්තමේන්තුවේ නිලධරයෙක් ; සහ

(ඊ) වරාය බෞද්ධ බල මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, නම් කරනු ලබන ඒ බල මණ්ඩලයේ නියෝජිතයන් දෙදෙනෙක්. මේ ඡේදය යටතේ පත් කරනු ලබන එක් එක් සාමාජිකයා ඔහුගේ පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සෙක් වන්නේ ය.

(2) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

2—ඒ 48422—10,500 (80/04)

(3) මණ්ඩලයේ රැස්වීම් හා එ් රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්ය පටිපාටිය මණ්ඩලය විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

(4) මණ්ඩලයේ සාමාජිකයන් පිළිබඳ යම් පුරප්පාඩුවක් තිබුණ ද මණ්ඩලය විසින් ක්‍රියා කරනු ලැබිය හැකි ය.

භාරයේ මුද්‍රාව.

4. භාරයේ මුද්‍රාව—

(අ) මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන තැනැත්තන්ගේ භාරයෙහි තිබිය යුතු ය;

(ආ) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය; තව ද

(ඇ) යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට මණ්ඩලයේ අනුමැතිය ඇතිව හැර හා තමන් පැමිණ සිටි බව පෙන්නුම් කිරීමේ සංකේතයක් වශයෙන් සාධන පත්‍රයට හෝ එම ලේඛනයට අත්සන් කළ යුතු මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර නොතැබිය යුතු ය.

භාරයේ පරමාර්ථ.

5. භාරයේ පරමාර්ථ—

(අ) සම්බුද්ධ ජයන්ති චෛත්‍යය ඉදිකිරීම සම්පූර්ණ කිරීම;

(ආ) එ් චෛත්‍යය නඩත්තු කිරීම සහ මනා තත්ත්වයෙන් තබා ගැනීම; සහ

(ඇ) බෞද්ධ සංස්කෘතික සහ අධ්‍යාපනික කටයුතු නංවාලීම විය යුතු ය.

භාරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

6. (1) භාරයේ පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ හෝ එ්ට හිතකර හෝ ආනුෂංගික වන්නා වූ හෝ සියලු දේ භාරයේ නාමයෙන් කිරීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරෙන බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත දැක්වෙන බලතල ක්‍රියාත්මක කිරීම හා පහත දැක්වෙන කර්තව්‍ය ඉටු කිරීම මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය:—

(අ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් අරමුදල් ලබා ගැනීම හෝ මුදලින් නැතහොත් ද්‍රව්‍යවලින් ලැබෙන ප්‍රදාන, තෑගි හෝ පරිත්‍යාග භාර ගැනීම;

(ආ) යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම නැතහොත් දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීම;

(ඇ) භාරය සතු බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම සඳහා ද භාරයේ පරමාර්ථ ඉෂ්ට කිරීම සඳහා ද අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හා එකඟවීම්වලට කෙළින් ම එළඹීම හෝ එ් ගිවිසුම් හෝ එකඟවීම්

කෙළින්ම ඉටුකිරීම හෝ නිලධරයන් හා සේවකයන් මගින් හෝ තත් කාර්ය සඳහා මණ්ඩලය විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ අනුයෝජිතයන් මගින් හෝ ඒ ගිවිසුම්වලට හෝ එකඟවීම්වලට එළඹීම හෝ ඒ ගිවිසුම් හෝ එකඟවීම් ඉටු කිරීම ;

(ඈ) භාරයේ නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම හා ඔවුන්ගේ පාරිශ්‍රමික ගෙවීම සහ සේවා නියුක්තයන් පත් කිරීම ද උසස් කිරීම ද ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම ද ඔවුන්ගේ විනය පාලනය කිරීම ද ඔවුන්ට නිවාඩු දීම හා වෙනත් ප්‍රතිලාභ දීම ද පිළිබඳව රීති සෑදීම ;

(ඉ) භාරයේ මුදල් ආයෝජනය කිරීම සඳහා නීතියෙන් බලය දෙනු ලැබූ යම් ආයෝජනවල, භාරයට අයත් අරමුදල් ආයෝජනය කිරීම සහ ආයෝජනය කරන ලද ඒ අරමුදල් ආපසු ලබාගැනීම, නැවත ආයෝජනය කිරීම හා ඒ ආයෝජන වෙනස් කිරීම සහ ඒ ආයෝජනය කිරීම්වලින් උපචිත වන්නා වූ ආදායම ලබා ගැනීම ;

(ඊ) භාරයේ ක්‍රියාකාරිත්වය හා සම්බන්ධ සියලු කාරණාවලට අදාළ රීති සෑදීම ; සහ

(උ) භාරයේ පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා අවශ්‍ය යයි නැත හොත් හිතකර යයි මණ්ඩලය විසින් සලකනු ලැබිය හැකි වෙනත් ක්‍රියා සහ දේවල් කිරීම.

සම්බුද්ධ ජයන්ති චෛත්‍ය අරමුදල පිහිටුවීම.

7. (1) සම්බුද්ධ ජයන්ති චෛත්‍ය අරමුදල යනුවෙන් හැඳින්වෙන (මේ පනතෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අරමුදල කළමනාකරණය කිරීමේ, පාලනය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ බලය මණ්ඩලය සතු විය යුතු ය.

(3) ආණ්ඩුව විසින්, භාරයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමේ කාර්යය සඳහා, භාරයට ආධාර මුදල් කලින් කල ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

ඇතැම් මුදල් අරමුදලට පැවරීම.

8. මේ පනත ආරම්භ වන දිනයෙහි සිට—

(අ) 1978 අංක 18 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයෙහි "45 වැනි ශීර්ෂය—කොළඹ වරාය කොමිෂන් සභාව —2 වැනි වැඩ සටහන—වරාය පහසුකම් (කොළඹ වරාය)" යන විෂයෙහි සඳහන් මුදල් ප්‍රමාණයෙන් 102 වන ව්‍යාපෘතිය : ස්ථාවර වැඩිදියුණු කිරීම් හා තැනීම්, 13 වන වැය විෂය විස්තර යටතේ බුද්ධ ජයන්ති චෛත්‍යය ගොඩනැංවීම සඳහා වෙන් කරන ලද රුපියල් 3,00,000ක් වූ මුදල, අරමුදලෙහි කොටසක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එකී රුපියල් 3,00,000 ක් වූ මුදලෙන් මේ දක්වා කරන ලද යම් ගෙවීමක් අරමුදලින් කරන ලද ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු ය :

(ආ) සම්බුද්ධ ජයන්ති චෛත්‍යය ගොඩනැංවීමේ කාර්යය සඳහා එකතු කරනු ලැබ, වරාය සම්බුද්ධ ජයන්ති චෛත්‍ය අරමුදලෙහි සහ වරාය බෞද්ධ මණ්ඩලයෙහි තිබෙන මුදල්, අරමුදලට පවරනු ලැබිය යුතු ය.

අරමුදලට කළ යුතු ගෙවීම්.

9. පහත සඳහන් මුදල්, එනම්—

(අ) 6 (2) වන වගන්තිය යටතේ ලබා ගන්නා ලද යම් අරමුදල් හෝ ලැබුණු ප්‍රදාන, ත්‍යාග නැතහොත් පරිත්‍යාග හෝ උප ලබ්ධ වූ හෝ එකතු කරන ලද මුදල් ;

(ආ) 7 වන වගන්තිය යටතේ ආණ්ඩුවෙන් ලැබෙන යම් ආධාර මුදල් ; සහ

(ඇ) ආයෝජනවලින් ලැබෙන යම් ආදායමක් හෝ භාරයට අය විය යුතු වෙනත් ලැබීම්

අරමුදලට ගෙවිය යුතු ය.

අරමුදලින් කළ යුතු ගෙවීම්.

10. පහත සඳහන් ගෙවීම් එනම්—

(අ) භාරය ක්‍රියාත්මක කිරීම, පිහිටුවීම හා පැවැත්වීම සඳහා අවශ්‍ය වියදම් ;

(ආ) චෛත්‍යය ඉදිකිරීම සම්පූර්ණ කිරීමේ, එය නඩත්තු කිරීමේ, එයට කොටස් එකතු කිරීමේ, එහි වෙනස් කිරීම් නැත හොත් වැඩි දියුණු කිරීම් සිදු කිරීමේ වියදම් ;

(ඇ) නිලධරයන්ට, සේවකයන්ට හා වෙනත් සේවා නියුක්ත යන්ට වැටුප් ගෙවීම් ; සහ

(ඈ) භාරයේ පරමාර්ථ ඉෂ්ට කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වේ යයි මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් සියලු ගෙවීම්

අරමුදලින් කරනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය.

11. (1) මණ්ඩලය විසින් භාරයේ ආදායම හා වියදම ද, වත්කම් හා බැරකම් ද, වෙනත් සියලු ගනුදෙනු ද සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තැබීමට සැලැස්විය යුතු ය.

(2) සෑම වර්ෂයක දී ම, විගණකාධිපතිවරයා විසින් භාරයේ ගිණුම් විගණනය කළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද භාරයේ ගිණුම් විගණනය කිරීම සඳහා අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හා විගණකාධිපති වරයා විමසා සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරයන් පත් කරනු ලැබිය හැකි ය. එවැනි පත්කිරීමක් අමාත්‍යවරයා විසින් කරනු ලැබූ විට, ඒ විගණකවරයාගේ හෝ විගණකවරයන්ගේ සේවය, භාරය සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ කාර්ය සා කර්තව්‍ය ඉටු කිරීම සඳහා යොදවා ගැනීමට තමා අදහස් කරන බව, විගණකාධිපතිවරයා විසින් ඒ විගණකවරයාට

හෝ විගණකවරයන්ට ලියවිල්ලකින් දන්වනු ලැබිය හැකි අතර, එසේ දන්වනු ලැබූ විට, ඒ විගණකවරයා හෝ විගණකවරයන් විගණකාධිපතිවරයාගේ මෙහෙයවීම හා පාලනය යටතේ ක්‍රියා කළ යුතු ය.

(4) (අ) විගණකාධිපතිවරයා විසින්, භාරයේ ගිණුම් විගණනය කිරීමෙහි ලා තමාට සහායවීමේ කාර්යය සඳහා තමාගේ මෙහෙයවීම හා පාලනය යටතේ කටයුතු කළ යුතු, සුදුසුකම් ලත් යම් විගණකවරයකුගේ හෝ විගණකවරයන්ගේ සේවය ලබාගත හැකි ය.

(ආ) භාරයේ ගිණුම් පිළිබඳ විගණනයට අදාළ යම් තාක්ෂණික, වෘත්තීය හෝ විද්‍යාත්මක ගැටළුවක් පරීක්ෂා කිරීමේ දී—

(i) භාරයෙහි සේවා නියුක්තයකු නොවන තැනැත්තකුගේ ; හෝ

(ii) භාරයේ කටයුතු කළමනාකරණයෙහි ලා කවර හෝ සම්බන්ධතාවක් ඇති ආයතනයක් නොවන යම් තාක්ෂණික හෝ වෘත්තීය හෝ විද්‍යාත්මක ආයතනයක

සහාය ලබා ගැනීම අවශ්‍ය බව විගණකාධිපතිවරයාගේ මතය වන්නේ නම්, ඔහු විසින් එපරිද්දෙන් ඒ සේවය ලබා ගත හැකි ය. තවද ඒ තැනැත්තා හෝ ආයතනය විගණකාධිපතිවරයාගේ මෙහෙයවීම හා පාලනය යටතේ ක්‍රියා කළ යුතු ය.

(5) (අ) විගණකාධිපතිවරයාට හෝ ඔහුගේ අධිකාරය ලද යම් තැනැත්තකුට, භාරයේ ගිණුම් විගණනය කිරීමේ දී—

(i) භාරයේ සියලු පොත්පත්, වාර්තා, වාර වාර්තා සහ වෙනත් ලියකියවිලි ලබා ගැනීමට ද ;

(ii) භාරයේ ගබඩාවලට සහ එහි වෙනත් දේපළවලට පිවිසීමට ; සහ

(iii) භාරයේ ගිණුම් විගණනය කිරීම ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි තොරතුරු සහ කරුණු පැහැදිලි කිරීම් මණ්ඩලය මගින් හෝ භාරයේ නිලධාරීන් මගින් ලබා ගැනීමට

හිමිකම තිබිය යුතු ය.

(ආ) භාරයේ ගිණුම් විගණනය කිරීම සඳහා පත් කරන ලද සුදුසුකම් ලත් සෑම විගණකවරයකුට ම නැතහොත් එවැනි විගණකවරයකුගේ අධිකාරය ලත් යම් තැනැත්තකුට, භාරය සම්බන්ධයෙන් එවැනි ම පිවිසීමකට, තොරතුරු ලබා ගැනීමකට සහ කරුණු පැහැදිලි කරවා ගැනීමකට හිමිකම තිබිය යුතු ය.

(6) විගණකාධිපතිවරයා විසින් භාරයේ ගිණුම් පරීක්ෂා කර මණ්ඩලය වෙත වාර්තාවක් සැපයිය යුතු ය.

(7) (3) වන උපවගන්තියේ විධිවිධාන යටතේ පත් කරන ලද සුදුසුකම් ලත් සෑම විගණකවරයකු විසින් තම වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර එහි පිටපතක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(8) මණ්ඩලය විසින්, අවසන්ව ඇති වර්ෂය තුළ භාරයේ වැඩ කටයුතු පිළිබඳ වාර්තාවක් හා මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවක් වාර්ෂිකව පිළියෙල කරනු ලැබිය යුතු අතර, ඒ වාර්තා, සුදුසුකම්

ලත් විගණකවරයාගේ වාර්තාව සමග, මුදල් තත්ත්වය පිළිබඳ ඒ වාර්තාව අදාළ වන වර්ෂයට ඉක්බිතිව එළඹෙන වර්ෂය ඉකුත් වීමට පෙර, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ද මහජනයාගේ දැන ගැනීම සඳහා ගැසට් පත්‍රයෙහි පළ කිරීම ද කරනු ලැබිය යුතු ය.

භාරයේ මුදල් වර්ෂය.

12. භාරයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

මේ පනත යටතේ වූ ක්‍රියා සම්බන්ධයෙන් මණ්ඩලයේ සාමාජිකයන් හා භාරයේ නිලධරයන් ආදීන් ආරක්ෂා කිරීම.

13. (1) මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් හෝ මේ පනතේ කාර්යයන් සඳහා පත් කරනු ලැබූ භාරයේ යම් නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් හෝ මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට සද්භාවයෙන් කරන ලද හෝ එසේ අදහස් කරන ලද හෝ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නොපවරනු ලැබිය යුතු ය.

(2) භාරය විසින් හෝ එයට විරුද්ධව හෝ යම් අධිකරණයක් ඉදිරියේ පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී භාරය විසින් දරනු ලැබූ යම් වියදමක් භාරයේ අරමුදලින් ගෙවිය යුතු අතර යම් එවැනි සිවිල් හෝ අපරාධ නඩුවක දී භාරයට ගෙවනු ලබන හෝ භාරය විසින් අයකර ගනු ලබන යම් ගාස්තු භාරයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට හෝ කරන ලද හෝ එසේ අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරනු ලැබූ යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දේ යයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ වියදම ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකරගෙන ඇතහොත් මිස, භාරයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

භාරයේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

14. භාරයට විරුද්ධව පවරනු ලබන යම් නඩුවක දී මණ්ඩලයේ යම් සාමාජිකයකුට විරුද්ධව හෝ භාරයේ යම් නිලධරයකුට විරුද්ධව හෝ සේවකයකුට විරුද්ධව හෝ පෞද්ගලිකව නැතහොත් ඒ තැනැත්තාගේ දේපළට විරුද්ධව කිසිම රිට් ආඥාවක් නිකුත් නො කරනු ලැබිය යුතු ය.

භාරයේ නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස දණ්ඩ නීති සංග්‍රහය යටතේ සැලකෙන බව.

15. දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා, භාරයේ සියලු නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

16. භාරය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එම පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය. භාරය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන බව.